# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

### මානවශාස්ත්‍ර පීඨය

### සාහිත්‍ය විචාරය

**සංස්කෘත සාහිත්‍ය විචාරයේ විකාසනය LTCR 28224**

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1 කොටස

01. පද්‍ය රචනයේ දී උචිත දෑ පමණක් උපයෝගී කොට ගැනෙන ආකාරය පහත පැදි ඇසුරින් පැහැදිලි කරන්න.

ගත විය කලක් අවුරුදු දහයක් ගෙවුනී
ඇසුර ද තුන් දෙනාගේ අඩු විය කෙමෙනී
මැහුම් ගෙතුම් හා සියබස දත් රමනී
හීන් මැණිකෙ දැන් හරි ලස්සන තරුනී

පායන පුන් සඳක් මෙන් වැසි වට සැණිනී
නාගෙන ගෙදර එන මේ ලස්සන තරුණී
කුඹුරෙන් ගඟට යන මඩ ගැවුන ගතිනී
අදිරිට මගදි සැන්දෑවක මුණ ගැසුණී

නියරෙන් ලියද්දට බැස මග හැර අදිරී
සුන්දර මුහුණ බැලුවා උතුරන මිහිරී
කලකින් මුණ ගැසුන අර ඉස්සර මිතුරී
දැන් හරි ලස්සනයි මල් ඉතිරෙන කුමරී

මතක් විය අතීතය ගැන එක පිටම
සිතුවිලි පහළ විය නාඳුනනා තරම
''කොහොමද ඉතිං කොහොමද? කලකින් මෙහෙම
හමු වන එක නොවෙද? ඇත්තට හරි පුදුම

02. ඖචිත්‍ය වාදයේ මූලාංග යසෝදරාවත ඇසුරින් නිදසුන් දෙමින් පහදන්න.

03. ධ්වනි වාදය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

04. ධ්වනි වාදය පද්‍ය විචාරයෙහි ලා උපයෝගී කරගත හැකි ආකාරය යෝග්‍ය නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

05. නූතන සිංහල කාව්‍ය විචාරයේ දී ඖචිත්‍ය සිද්ධාන්තයෙන් ලැබෙන පිටුබලය කෙබඳු දැයි නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

## 11 කොටස

06. ගුණ - රීති හා වක්‍රෝක්ති න්‍යායයන් පදනම් කොට ගනිමින් පහත නිර්මාණ පිළිබඳ විවරණයක් සපයන්න.

සැදි රත තඹර පෙළ රන තිසරුන් රුවැති
විදි දිය දහර ලෙළ දෙන දිගු නරු පටැති
රඳි රළ රළැති හොය දියවන්නා නමැති
ඇඳි පුර අඟන පට සළු සිරි රුපැයි නිති

සමනොළ මුහුළ මහ සමුදුර මෙවුල් බර
සුල කළ පුවළ ලකඟන සිරි යොවුන් වර
තර කළ විසල් වාසල් යතුරු මෙ නුවර
බැඳ හළ රුවන් තනපට කියෙලිය පවුර

නල මුදු සුවඳ පිරිකුඹු මියුරු අඹ ගෙඩි
පුල හෙළ කුසුම ලිය පිය තෙපල රන් කෙඬි
සල සුදු සෙමෙර සේසත් ගිපිඳුනොද වැඩි
බල සුබ නිමිති පෙරමග නැකතටත් වැඩි

පෙරව සඳ කිරණ පිපි කුමුදු මල් වටින්
පරව තඹර පෙති ගිලි දියතලා පිටින්
තරව සිහි ඇති ව පරතෙරට යන අටින්
කරව පියාසර සකි කොන්තගම් තොටින්

07. ගුණ, රීති, දෝෂ යන සංකල්ප අතර ඇති අන්‍යොන්‍ය සමාබද්ධතාව පැහැදිලි කරන්න.

08. දශවිධ කාව්‍යගුණ නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.

09. "වක්‍රකවි ව්‍යාපාරය සමඟ බැඳුණු ආහ්ලාදකාරී වූ ශබ්දාර්ථ සුසංයෝගය කාව්‍ය නමි." පැහැදිලි කරන්න.

10. සංස්කෘත විචාරවාද අතර පවතින අන්‍යොන්‍ය සම්බන්ධතාව නිර්මාණ කෘතියක් රසාස්වාදය කිරීමේ දී භාවිතයට ගත හැකි ආකාරය සනිදර්ශන ව පහදන්න.

(එක් පිළිතුරකට ලකුණු 20 බැගිනි)

******************************